බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ විමසුම් ඇසට ලක්වූ යටත් විජිත ලංකාව

ලංකාවේ මහා පාවා දීම ලෙස සැලකෙන උඩරට ගිවිසුම මගින් උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට ලියා පවරා දීම සිදුවී වසර 191 ක් ගත වී ඇති මේ මොහොතේ 19 වන සියවසේ ලංකාවේ පැවති සංස්කෘතික පසුබිම බ්‍රිතාන්‍ය ජාතිකයෙකුගේ ඇසට ලසවී ඇති අයුරු විමසා බැලීමේ යම් වැදගත් කමක් ඇතැයි සිතමු. අප මේ කොටස් වශයෙන් ඔබ වෙත ගෙන එන්නේ 1892 දී ලියා පළ කරන ලද ඇලන් වෝල්ටර්ස් ගේ පාමිස් ඇන්ඩ් පර්ල්ස් නම් වූ කෘතිය අසුරෙන් සකස් කළ ලිපි පෙළකි.

තල්, පොල් සහ මුතු පබා

දහ වන කොටස

ජෝගදෙණිය උදහිද උදානයේ සිට දෙදේ, ගම්මේස් වැස් ආදියෙන් යුත් කුඩා ගෙවතු වලින් සැදි තිබෙන් අතරින් දිවෙන තමන් මහ ගස්සේ තවත් සැසපුම් තුනකගාරක් පමණ ඇවිද ගෙන ගිය අප පිවසුණේ ස්වදේශිකයින් විසින් මනනුවර යනුවෙන් හඳුන්වනු ලබන නගරයටයි. එහි දුම්රිය ස්ථානය මුහුදු මට්ටමේ සිට අඩි 1602ක් ඉහලින් පිහිටා ඇත. මෙහි තිබෙන අඟ ආණ්ඩුකාරවරයාට අයිති ප්‍රාදේශීය හිවස නුණු බදාමයෙන් මනාව ඔපමට්ටම් කළ එකකි. පෙනුම කිරි ගරුසව වලට නොදෙවෙනිය.

පැරණි අග නගරයේ ඇති නියම ආකර්ශනීය ස්ථාන නම් රජ මාළිගය සහ බොද්ධ විහාරස්ථානයයි. මාළිගය තනනු ලැබ ඇත්තේ 1600 දී පෘතුගීසි සිරකරුවන් විසිනි. එය හේතු කොට ගෙන නිසැකයෙන්ම එහි සමහර කොටස් යුරෝපීය පෙනුමින් යුක්තය. මගේ අදහසට අනුව නම් මෙය කැලන් පුළුළුව පිහිදී පැවති ගොඩනැගිල්ලක් බවයි. සමහර විට මගේ මතය සාවද්‍ය වීමටද ඉඩ ඇත. දැනට හාවිතයට ගන්නා කාමර නවීකරණය කරනු ලැබ ඇති අතර එහි විශේෂ අමුත්තන්ගේ කාමරයේ වර්තමාන දිස්ත්‍රික් අධිකරණය පවත්වා ගෙන යයි. එහි තිබෙන කේක්ක දැවයෙන් කළ සමහර කුළුණු වල මුදුන් තුන සියුම් කැටයම් වලින් අලංකාර කර තිබේ. රජ දවස ඇමතිවරු සතර ගාතයෙන් සිට දුවිලි ලෙවකන තරමට බිමට පහත් කරගත් මුහුණුවලින් යුතුව මහරජු බැහැර දැක්කේ මේ ශාලාවේදීය.

රජ දවස ඇමතිවරු සතර ගාතයෙන් සිට දුවිලි ලෙවකන තරමට බිමට පහත් කරගත් මුහුණුවලින් යුතුව මහරජු බැහැර දැක්කේ මේ ශාලාවේදීය.

ඉංග්‍රීසි ජාතිකයා එදා දුටු මහනුවර

ඉතින්දී ඇත් පොර සැදා යොදා ගත් විවෘත භූමි භාගයකට මුහුණ ලා තනා ඇති, ගොඩනැගිල්ල වටා දිය අගළක් ද සහිත මාළිගාවේ ඉඳිරිපස පෙනුම ශෝභනය. එම දිය අගළ දැන් වසා දමා ඇත. පිටිවාසියට ඔබිබෙන් ඇති සසපුම් තුන්කාළක් පමණ දිග කෘතිම වැව මැද කුඩා දූපතකි. රජුගේ අන්තඃපුරය තිබී ඇත්තේ එහිය. අද එම දූපත වෙඩි බෙහෙත් අසතුව පුපුරන ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා යොදා ගනී. ඉන් එපිටින් ඇති කඳුගැට පේළිය නගරය වට කොට ගැබී සිටී. නුවර නගරයේ පිහිටීම ඇත්ත වශයෙන්ම දර්ශනීයය. එහෙයින් මෙම ස්ථානය එහි ඇති ඓතිහාසික වර්ථනකම අභිබවා යන විශේෂත්වයක් දසුලයි. ගෙබර් බීණෝප් තුමා මෙම ස්ථානය ශ්‍රීන්දුන්තයේ අයිස් කඳුවැලට සමාන කර ලියමින් සියල්ල සියළු ආකාරයෙන් සතුටුදායක ලෙස ඇති නමුදු එහි සිටින මිනිසුන් පමණක් අධම යයි කීවේය. එකත් එකටම ඔහු එසේ ලියන අවස්ථාවේ යමක් සප්පායමේ ව සිටින්නට ඇත. සාමාන්‍ය සිංහල හෝ දෙමළ ජනයාගේ පැවතුම් කොයිම ආකාරයින් හෝ අධම යන හේරුමට සමාන නැත. සදාචාරය අතින් ඔවුනු සෑම ඉරිදාවකම පල්ලියට හෝ දේවස්ථානයට යන සුළු සංඛ්‍යාවක ඉංග්‍රීසි ජාතිකයින්ට සෑම අතින්ම සම තත්වයේ සිටිති.

රජ මාළිගයට යාබදව ඇත්තේ ලෝක ප්‍රකට ශ්‍රී දළදා මාළිගාවයි. බෞද්ධයින්ට එතැන මහමදියන්ට මක්කම හා කාබාව මෙනි. පිටත සිට බලන කල එය එතරම් අලංකාර විසල් ගොදුරක් නොවේ. එයට අසතුව එම සඳහා අඳුරු කාමර එකක් හෝ දොකක් පසුකර ගිය තපන අත් දළ එකිබවු විදියෙන් කුළ ශක්තිමත් ලොරක් වෙත ළඟා වේ. එය විවෘත කල විට අත්තේ කුඩා අඳුරු විහාර ගෙයකි. එහි විහාල දිදී මෙසයකට පසුපසින් දාගබැන හෝ මීන්තරයකින් හරි අඩක හැඩය ගත්, අඩි පසක් පමණ උසයි. දිදීයෙන් කළ කරඬුව තබා ඇත. එකක් තුළ එකක් පිහිටන පරිදි එතුළ කරඬු පහක් ඇත. ඉන් දොකක් අදහා මැණික් සහ ආභරණ වලින් විචිත්‍ර ලෙස සරසා ඇත. කුඩාම කරඬුව තුළ දන්ත ධාතුව, නැතහොත් ලුවෙක් වවන වලින් කියනොත් නියම දන්ත ධාතුව (අහෝ දෙවියනි! දැනට ඇති ධාතුව මනුෂ්‍යයෙකුවේවත් පුජනීය වස්තුවක්වත් නොවේ.) සතුව සිද්ධාලයක් සහ අතින් අත ගිය ඉතිහාසයක් ඇත. ක්‍රිස්තියානි යුගයට සියවස් කිහිපයකට පෙරාතුව බ්‍රාහ්මණ පණ්ඩු නම් වූ බලවත් පාලකයෙකු හට සිය යටත් වැසි ගුහසීව තමෙන්ම කිසියම් අට කැබැල්ලකට වන්දනා කල බව අසන්නට ලැබුණි. එය අන් කිසිවක් නොව වර්තමානයේ ජනගාත් තමින් හඳුන්වන එවකට කාලිංග දේශයේ සිටවස් අටක් ආරක්ෂා කරගෙන සිටි නොතම බුදුන් වහන්සේගේ වම් දරුනක දන්ත ධාතුවයි. අධික ක්‍රෝධයක් පත් පණ්ඩු එය පැහැර ගෙන ගොස් වනාන කිරීමට උත්සාහ දැරීය. නමුත් එය ඉතා අසීරු කරුණක් විය. දන්ත ධාතුව ගිනි ගෙන දැවෙන ගල් අතුරු සහිත බඳුනකට දමූ විට ගිනි දැල් අතරින් නෙවම් මලක් මතු වී දන්ත ධාතුව සිසිලු හාතියකින් තොවට එය මත වැස ගිඳිනු දැක ගත හැකි විය. අධික බරු ගි මීරියකින් හැළුවද කිසිවක් සිදු නොලැබී. දුරද හමන අපවිත්‍ර කානුවකට එසි කල විට අනිල දය වට කොට මල් උයනක්ම හට ගැණිග. මේ සියළු ආශ්චර්යයන්ගේ අවසාන ප්‍රතිඵලය වූයේ පණ්ඩු බුද්ධානම වැළඳ ගැනීම හා දන්ත ධාතුව නැවත පූජාසනයේ පිහිටුවීමය.

බුද්ධ වර්ෂ 302 දී තැවත එය අනතුරට ලක් වන ළකුණු පහළ වූයෙන් කීර්ති ශ්‍රී මේඝ වාම ගේ දියණියක් දන්ත ධාතුව සිය කෙස් කළඹෙ සඟවා ගෙන ලංකාවට පළා ආවාය. ඉන්පසු අවුරුදු 900ක් පුරා එය තිරසෙඩ්ලක් තිබුණි. ඉන් අනතුරුව එය දමිළයන් අතට පත්වී තිබී අවුරුදු කිහිපයකට පසුව දෙවන පරාක්‍රම රජු විසින් බේරා ගනු ලැබීය. 156වැනි පාතුගීසි ජාතික කොන්ස්තන්තිනු ද බුගන්සා විසින් සිය ගුගණයට ගනු ලැබූ ශ්‍රී දන්ත ධාතුව ගෝවට රැගෙන ගොස් එහිදී අගරදඟරය හා ඔහුගේ සහාව ඉදිරියේදී ඉතා කුඩා අංශු වලට තුඩු කොට දැමුවේ යයි කපිතාන් ජේ ඊබෙයිරෝ සිය ඇසින් දුටු සාක්ෂි දී ඇත. වර්තමානයේ ඇති දත අඟල් දෙකක් දිග, අඟලක ඝනකම ඇති, නිසැකයෙන්ම මනුෂ්‍යයෙකු සතුව තිබීය නොහැකි එකකි.

එතරම් ප්‍රජාවට පාතු නොවූ එහෙත් සැබැවින්ම ධාතුවක් යයි පිළිගත හැකි තවත් යමක් මෙම පන්සලෙහි සුරක්ෂිතව ඇත. එය නම් බුදු රජාණන් වහන්සේ ආහාර වැළඳූ පාත්‍රා ධාතුවයි. යුරෝපීය ජනප්‍රවාද වල සඳහන් වන පරිදි දේශු තුමා සිය අවසන් හෝජනයේදී පාවච්ච කල බඳුන අපූර්ව පෝෂණ බලයක් සහිත එකකි. මෙම පාත්‍රා ධාතුවටද බුදු ඉතාමම ඒ හා සමාන වර්ථනකමක් තිබේ. ජේමාතු ලේඛකයින් ක්‍රිස්තියානි ආගමේ ජේසු තුමා පාවච්ච කළ බඳුනට එවැනි අද්භූත බලයක් දී ඇත්තේ නිසැකයෙන්ම නුවර ඇති මෙම පාත්‍රා ධාතුවේ මුළාශ්‍ර අනුව යමින් විය යුතුය.

නව වසරේ මුල් සතියේ දී දළදා මාළිගාවේ පැවති උත්සවයකට සහභාගී වීමට මට අවස්ථාව ලැබුණි. ඒදින එහි අති විශාල ජනකායක් රැස් වූ අතර ඒ සියළුම දොන සපු මල් හෝ වෙනත් සුවඳැති මල් පූජා පිණිස ගෙන ආහ. සංගීත වාදකයෝ තම්බෙරිටම්, හලා, බටහලා, හක් ගෙඩි අසුරෙන් සිසිම තාලයකට නැති සංගීතයක් වැයූහ. කසාවතින් සරසනු ලැබූ කිත්මුනු දුන්මුසු හඬකින් ඒකාකාරී ස්වර අවරෝහණයකින් යුත් පිරිත් සජ්ජායනා කළහ. අවට වාතය පිඩකාරී ලෙස හඳුන්වනු දුම්මල් බරවී රහවී තිබුණු අතර විදුලි එළි ධාරා රාශියකින් පන්සලේ ගොඩනැගිලි ගිනිගෙන දැවෙන්නාක් මෙන් දිස් විය. එම උත්සවයේ වඩාත්ම මා සිත් ගත් එකම දෙය නම් ලෝක ජනගහණයෙන් හතරෙන් එකක්, නැතහොත් මිලියන 350 ක් වූ මගේම සහෝදර පිරිසක් විසින් අදහනු ලබන හා විශාල ගරුසව බැඳි සිටින ආගමික උත්සවයක මෙද හඳුල් කාරයෙක් ව සිටීම යන අවලෝකණයයි. *(සටහන - 1891 දී ආචාර්ය වැන්හෑව් හා ආචාර්ය පුපත් විසින් ප්‍රකාශයට පත්කල පරිදි එවකට ලෝක ජනගහණය මිලියන 1479ක් වූ අතර ආසියා-වේ ජනගහණය මිලියන 825ක් විය. යුරෝපීය ජනගහණය ලෝක ජනගහණයෙන් අඩකටත් වඩා අඩු පිරිසකි)*

මා නිරීක්ෂණය කළ පරිදි මිනිසුන් 400කට එක් අයෙක් වන කිත්මුනු ගිහියන්ගෙන් ලාභ සත්කාර හෝ වැසි බුහුමන් නොලබති. නියසකවම ඔවුනු තුනතුන් මෙන්ම ඔවුන් වටා සිටින මහා ජනකායට වඩා කිසි ලෙසකින් හෝ උසස් නොවෙති. දානයන් පමණක් යැපෙන සමුහයක සාමාජිකයින් ලෙස ඔවුන් ඉතා සුළු වර්ථනකමකින් යුත් හාණ්ඩ ස්වල්පයක් පමණක් පරිහරණය කරන බව පිටත ලෝකයට පෙන්වුවද, යථාර්ථය නම් ඔවුන් ලංකාවේ සිටින පොහොසත්ම මිනිසුන්ගේ කොටසට අයත් වන බවයි. බොහොමයක් පන්සල් වලට පෙර සිටි රජ වරුන්ගෙන් ප්‍රදාන ලෙස ඉඩම් විශාල වශයෙන් හිමිව තිබෙන අතර, ඒවායින් සමහරක් ක්‍රිස්තුස් වහන්සේ ගේ කාලය දක්වා වගිදේ.

සාමනේර නැතහොත් ගණිත්නාන්සේ සහ තෙරුන්නාන්සේ යනුවෙන් කිත්මුනු වහන්සේලා ශ්‍රේණි දෙකකට අයත් වේ. පොදු ව්‍යවහාරයේදී ඔහුන් බොන්සේ යන ඒන වඳනේ තේරුමින්, එතම, ගරු කටයුතු යන අරුතින් ආමන්ත්‍රණය කරනු ලබති. කහ සිවුරක් අඳින ඔවුනු සිවුර එකට එකතු කොට වම් උරහිසේ රඳවා දකුණු ලපැත්ත හිරාවරණය තබති. මුල්මවුළු දිව පැවැත්ම සහ මස් අනුභවයෙන් වැළකී සිටීම අභිධාර්ය වුවද මෙහි කී දෙවෙන්න පෙරට වඩා දැන් ලිහිල් ව පවතින සෙයකි. ඔවුන්ගේ ප්‍රධාන ආහාරය බත් සහ බීත්තර ය. පිඬු සිඟා හොස් ආහාර ලබාගෙන මධ්‍යාහ්නයට පෙර

නුවර පෙරහැර සහ සිංහල ප්‍රභූවරයෙක්
- බ්‍රිතාන්‍ය පාලන සමය

23 පිටට